10 පුවත් පත් විශේෂාංග ලිපි

පුවත්පතක පළ වන විවිධ ලිපි අතරින් විශේෂාංග ලිපිවලට වැදගත් තැනක් හිමි වෙයි. එදිනෙදා සිදුවීම් සම්බන්ධ වාර්තා ද වාර්තා ද නිවේදන සහ දැන්වීම් ද කතුවැකිය, කාටූන් චිත්‍ර හා සම්මුඛ සාකච්ඡා ද විශේෂ ශාස්ත්‍රීය ලිපි ද හැරුණු විට පොදු පාඨකයාගේ උනන්දුව දල්වන අගයකින් යුතු පුවත්පත් ලිපි, විශේෂාංග ලිපි ගණයෙහි ලා සැලකෙයි. විශේෂාංග ලිපියක් නිර්මාණාත්මක ගුණයෙන් ද යුක්ත වීම අපේක්ෂා කෙරේ. මේ පාඩම එවැනි විශේෂාංග ලිපියක් නිර්මාණය කිරීමේ කුසලතාව වර්ධනය කිරීමේ අරමුණින් සම්පාදනය වූවකි.

විශේෂාංග ලිපියක් ප්‍රවෘත්තියක් හෝ වාර්තාවක් මෙන් ම සමාජ වැදගත්කමකින් යුක්ත වෙනත් මූලාශ්‍රයයක් ද පදනම් කොට ගනිමින් සම්පාදනය කළ හැකි ය. එහි ප්‍රධාන ලක්ෂණය විය යුත්තේ පාඨකයා කියවීමට ප්‍රිය කරන මාතෘකාවක් නො ව පාඨකයාට වැදගත් වන මාතෘකාවක් අළලා සම්පාදනය විය යුතු වීම යි.

මහජන සුබසිද්ධිය සඳහා වන මාධ්‍ය ආචාරධර්ම ආරක්ෂා කරමින් මූලාශ්‍රයයට අදාළ සෑම පැතිකඩක් ම ආවරණය වන පරිදි සිදු කෙරෙන නිර්මාණාත්මක විග්‍රහයකින් යුක්ත වීම මෙන් ම අන්තර්ගතය සමබර වීම ද එහි ලා අත්‍යවශ්‍ය වේ. ඒ සියල්ල සමඟින් වැදගත් වන්නේ රචනයේ නිර්මාණාත්මක ගුණය යි. එනම් ඉදිරිපත් කරන කරුණු අපූර්වත්වයකින් යුතු ව ගෙන හැර පෑමේ කුසලතාව යි.

විශේෂාංග ලිපියක් එහි අන්තර්ගත කරුණු සම්බන්ධ සෑම පාර්ශ්වයක් ම ආවරණය කරමින් සම්පාදනය කරන ලද්දක් විය යුතු ය. තොරතුරු, කරුණු හා දත්ත ආදිය පදනම් කර ගනිමින් පාඨකයාට නව දැනුම ලබා දෙන ආකාරයෙන් සම්පාදනය විය යුතු ය. ඒ සඳහා රචකයා අදාළ කරුණු ගවේෂණයෙහි නිරත විය යුතු ය.

විශේෂාංග ලිපියක් රචකයාගේ පෞද්ගලික අදහස් හා මතවාද ප්‍රකාශ නො කෙරෙන්නක් මෙන් ම ලේඛකයා සිය සිතැඟි අනුව සම්පාදනය කරන රචනයක් විය යුතු ය.

ප්‍රස්තුතය සම්බන්ධ සමාජ සංවාදයකට තුඩු දෙන්නක් වීම මෙන් ම පාඨකයාගේ දැනුම අවදි කිරීමක් ද එමඟින් සිදු විය යුතු ය. විශේෂාංග ලිපියක් යනු රසවත් කතාන්තරයක් නො වේ. මුල් ප්‍රවෘත්තිය දන්නා පාඨකයාට ඒ සම්බන්ධ ප්‍රකාශ, සංඛ්‍යා, දත්ත ආදිය මාර්ගයෙන් හා විවිධ කෝණ ඔස්සේ ගැඹුරු අවබෝධයක් එමඟින් ලබා ගත හැකි වීම අපේක්ෂා කෙරේ.

පහත දී ඇති ප්‍රවෘත්ති වාර්තාව කියවන්න.

ඉංජිනේරුවන්ට අපහසු වැඩක් ගොවියකුගෙන් ඉටු වේ

මහවැලි අධිකාරිය විසින් ජලය සැපයිය නොහැකි යැ යි අත්හැර දමා තිබුණු අක්කර 100ක පමණ බිමක් එක්තරා ගොවි මහතකුගේ වෑයම නිසා සාරවත් කුඹුරු යායක් බවට පත් වී ඇති සැටි බරවාකුඹුකේ අබේසේකර ගමෙන් වාර්තා වේ.

මේ ඉඩම ගොවි ජනතාව අතර බෙදා දී අවුරුදු 20ක් පමණ ගත වුව ද, ඇළ පිහිටියේ ඉඩම්වලට පහළින් නිසා වතුර ලබා ගැනීමට අපහසු විය. ඒ ඉඩම්වලට ජලය සැපයීම කළ නොහැකි දෙයක් බව වාරිමාර්ග ඉංජිනේරුවෝ පැවසූහ. මේ නිසා කුඹුරු සඳහා රජය ලබා දුන් ඉඩම් හේන් යායක් බවට පත් විය.

මේ අතර ඩබ්ලියු. සියදෝරිස් නමැති 50 හැවිරිදි ගොවි මහතෙක් තමාගේ වුවමනාවෙන් තනි ව ම කුඩා වැවකින් ඇළක් කපා මේ ඉඩම්වලට වතුර සැපයූවේ ය. හේන් යාය සාරවත් කුඹුරු යායක් බවට පත් විය.

පසුගිය කන්නයේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ වාර්තාගත වී අස්වැන්නක් මේ කුඹුරු යායෙන් ලැබී තිබේ.

පහතින් පළ වන්නේ එම ප්‍රවෘත්තිය පදනම් කොට ගත් නිර්මාණාත්මක විවරණයකි:

බරවාකුඹුකේ සියදෝරිස් ව්‍යාපාරය

ගිනි කාෂ්ටක අව්ව!

දෑසට මහා ගිනියමක් දැනිණ.

ගිනි කබලක් මත දෙපා රඳවා සිටින ආකාරයක් ඔහුට දැනිණ. ඔහු ගමන ඉක්මන් කළේ ය. ඔහුගේ කරට නැඟ සැතපුම් ගණන් ගමන් කරන උදැල්ල ඔහුට අද බරකි. කෙණ්ඩා ද රිදේ. කුලී වැඩක් සොයා ගෙන යන මේ ගමන දිනපතා කළ නොහැකි ය. ඔහුගේ සිතට කේන්තියක් ද ශෝකයක් ද නැගිණ. හැඩි දැඩි සිරුරක් තිබුණ ද, සවි ශක්තිය නොඅඩු වුව ද තාමත් ඔහු දුප්පත්කමට පරාද ය.

ඔහුගේ නම සියදෝරිස් ය. උපන් ගම හක්මන, වේපතඉර ය. ගමේ ඉඩම්වලින් හතරෙන් තුනක් ම උරුම වූයේ ගමේ පන්සලට සහ තවත් පවුල් දෙකකට ය. ඉතිරි හතරෙන් පංගුවේ හත් අට සීයක් පවුල් ජීවත් වූහ. සියදෝරිස්ගේ පියාට අයත් වූයේ අක්කර කාලකටත් වඩා අඩු ඉඩම් කැබැල්ලකි. පවුලේ අට දෙනෙකි. ඔවුන් අතර බෙදී යෑමට තරම් ඒ ඉඩම ලොකු නො වී ය.

සියදෝරිස් මාතර පැවති ඉඩම් කච්චේරියකට ගියේ ඒ නිසා ය. ඔහුට චන්ද්‍රිකා වැව යෝජනා ක්‍රමය යටතේ බරවාකුඹුක අබේසේකර ගමෙන් අක්කර තුනක කුඹුරු ද, අක්කර දෙකක ගොඩ ඉඩම් ද ලැබිණ.

සියදෝරිස් ඉඩම් ලැබුණු පුවත ගමට කීවේ ඉහවහා ගිය සතුටිනි.

"අක්කර කාලෙන් කාලක් වත් නැති මිනිහෙකුට අක්කර පහක්.!" මෙය ඉවසුම් නොදෙන සතුටකි. ඔහුගේ කිසි ම නෑදෑයකුට මේ තරම් විශාල ඉඩමක් නැත.

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

හට්ටි මුට්ටි, පැදුරු කොට්ට ආදි ලට්ට ලොට්ට ලොරියක පටවා ගෙන ඔහු අබේසේකර ගම පදිංචියට ආවේ ය.

අලුත් ඉඩම්වල වූයේ කටු අකුල් ය. ලඳු කැලෑ ය. ඒ ඉඩම්වල ඇවිදින විට ඔහුගේ පයට ගිනියමක් දැනුණේ නැත. මහ පොළොව මහත් සතුටින් පතුල් සිඹිනවා මෙන් දැනිණ.

"රත්තරන් පොළොව.!"

ඔහු පස් ටිකක් අතට ගෙන සිය බිරියට පෙන්වමින් කී ය.

එහෙත් පසු ව ඔහු ඒ පොළොව හැඳින්වූයේ 'යකඩ පොළොව' කියා ය. කපා ඇති ඇළවල් ඒ පොළොවට වතුර නොදීම ඊට හේතුව විය.

සියදෝරිස් සමග අලුත් ඉඩම්වලට ආ පවුල් තිස් පහට ම වතුර ලැබෙන මඟක් නො වී ය. මේ නිසා ඔවුන්ට සිය ඉඩම්වල වගා කිරීම අපහසු විය.

සියදෝරිස් ඇතුළු පිරිස වතුර ඉල්ලා රජයේ කාර්යාලවලට යැවූ පෙත්සම්වලින් පලක් නො විණ. ඇළ ගියේ ඉඩම්වලට පහළිනි.
"කරන්න දෙයක් නැහැ. මුලින් ම වෙච්ච වැරැද්දක් මේක," නිලධාරීහු කීහ.

සියදෝරිස් සමග අනෙක් ගොවීහු වැසි කාලයට සිය ඉඩම්වල මුං ඇට වපුළහ; රට කජු සිටවූහ. එපමණි.

වතුර ලැබෙන ඉඩම්වල කුලීකාරයන් බවට සියදෝරිස්ලා පත් වූහ.

"අපි ඉතින් ගමේ ගත කරපු ජීවිතේ තමයි තාමත් ගෙවන්නෙ," බිරිය ඔහුට නිතර කීවා ය. ඇගේ කනපින්දම ඔහුට වධයක් විය.

"අපි මේව අතහැරල කොහේ හරි යමු," ඈ යෝජනා කළා ය. මඳ වේලාවක් නිහඬ ව සිටීමෙන් පසු,

"මේවා රත්තරන් ඉඩම්," යි සියදෝරිස් කීවේ ය.

"රත්තරන් හැංගිලා. ගල් බොරලු මතු වෙලා... අපට ඕවායින් වැඩක් නැහැ," ඈ පිළිතුරු දුන්නා ය.

"ඉඩම්වලට වතුර ආවොත් හැංගිච්ච රත්තරන් මතු වේවි," සියදෝරිස් කී ය.

ඔහුගේ පුත්තු තිදෙනා සහ දුව ගියේ අබේසේකර ගම පාසලට ය. අම්මාත්, තාත්තාත් කුලී වැඩට ගිය දිනවල දුවට ගෙදර නතර වීමට සිදු වේ. පුතුන් ඉගෙනීමට දක්ෂ වුව ද ඔවුන්ගේ පාසල් ගමන කඩින් කඩ කැඩිණ.

වතුර ඉල්ලා රජයේ ලොකු තැන්වලට ලියූ පෙත්සම් තැපෑලට දැමීමට ගිය වියදම්වල වටිනාකම සියදෝරිස් මාසයක් ම කුලී වැඩ කොට ලබා ගත් මුදලට සමාන විය.

"මං තවත් නම් පෙත්සම් ලියන්නේ නැහැ," යි ඔහු කී ය.

ඒ පුර පසළොස්වක පෝය දවසකි.

සියදෝරිස් අබේසේකරගම පාසල අසලින් වැටුණු පාර දිගේ ගොස් රොට වැවේ ඉවුරට නැගුණේ ය.

ඔහුට ඔහුගේ ඉඩම පිහිටි ඉසව්ව එතැනට පෙනිණ. ඔහු ඒ දෙස බලමින් සුසුමක් හෙළුවේ ය. ඒ සමග ම ඔහුට පෙනුණේ රොට වැවේ පිටවාන ය.

හැමදා ම රොට වැවේ පිටවානෙන් විශාල වතුර ප්‍රමාණයක් පිටතට ගලා ගොස් මහ ඇළට වැටේ.

රොට වැව යටතේ ඇති කුඹුරුවල ගොවීන්ට දෙකන්න පුරා ම බත් කන්නට ලැබේ.

'ලොකු වතුර කඳක් පිට වී යනව. ඒත් අපේ ඉඩම්වලට වතුර බිංදුවක් නැහැ,' යි සිතූ ඔහු ඉවුර දිගේ පහළට බැස සිය ඉඩම් කට්ටි ඇති දිසාවට යළි දෑස යැවී ය.

'පෝය නිසා අද කුලී වැඩත් නැහැ.'

ඔහු උදැල්ල අතට ගත්තේ ය. උදැල්ල ඔහුගේ අතේ ම ය. එය ශරීරයේ ම කොටසක් මෙනි.

සිතේ කෙටූ විදුලියක් මෙන් ඔහුට ක්ෂණික අදහසක් පහළ විය. ඔහු වැව දෙසත්, සිය ඉඩම දෙසත් බැලී ය.

'හැතැප්ම බාගෙකට වැඩිය දුර නැහැ.'

උදැල්ලෙන් පොළොවේ 'මඟ' ලකුණු කරමින් ඔහු සිය ඉඩම දෙසට ගමන් කළේ ය; තැන තැන කැපුවේ ය; ලකුණු කළේ ය. ඉඩම්වලට ළං වන විට පැය දෙකක් පමණ ගෙවිණි. ඔහු ආපසු වැව දෙස බැලී ය.

"මට වරදින්න බැහැ. මට ඕන විදියට තමයි පොළොව පිහිටල තියෙන්නෙ. ආපු පාර හොඳයි," ඔහු සිය බිරියට කීවේ ය.

"මොකක්? ඔළුව නරක් වේගෙන එනව වගේ." ඇයට කියැවිණි.

"ඔළුව නරක් වේවි තව ටිකක් කලක් මෙහෙම හිටියොත්."

"ඔය විධියට වතුර ගන්න පුළුවන් නම් මෙච්චර කල් මෙහාට ආපු ඉංජිනේරු මහත්වරුන්ට ඇයි ඕක පෙනුණෙ නැත්තෙ?" සියදෝරිස් සිනා සුණේ ය.

"අපේ ඉඩම් මහ ඇළට උඩින් නිසා ලොක්කෝ ඕක අත ඇරල දැම්ම. වතුර ලැබෙන මඟක් හදා දෙන්න උන්නැහේලට ඕන නැහැ. ඕනකම තියෙන්නෙ අපට. අපි ඒක කරන්න ඕන."

"ඉතිං දැන් මොකක් ද කරන්න යන්නෙ?"

"ඇළක් කපනවා."

"තනියම?"

"නැහැ. මෙහේ ඉන්න කාටත් කතා කරනවා."

"ඒවි ද?"

"ඒවි."

එදා රාත්‍රී සඳපානේ ඔහු සිය අසල්වැසියන් සමඟ මේ ගැන කතා කළේ ය.

"පලයන් සියදෝරිස් පිස්සු කතා නොකර. උඹ ම නේ පෙත්සම් ගහල වතුර ගන්න හැදුවෙ. දැන් උඹ ඇළක් කපන්න යනව," ඔවුහු කීහ.

"පෙත්සම් ගහල බැරි තැන තමයි මම මෙහෙම දෙයක් ගැන හිතුවෙ. මං ඇළ පාර ලකුණු කළා. උඹලත් මට එකතු වෙයල්ල."

"ඕකට ගත කරන්න අපට වෙලාවක් නැහැ. හෙට අපට වැටිය යායෙ වැඩ තියෙනව."

"කුලී වැඩවලින් නිදහස් වෙලා අපේ ම කුඹුරක වැඩ කරන්නයි මට ඕන."

"වතුර ලැබුණු කාලෙක අපිත් එහෙම කරනවා."

සියදෝරිස් පසු දා උදෑසන උදැල්ල ගෙන අර ලකුණු කළ මාර්ගයේ කොටසක් ගැඹුරට කැපුවේ ය. සවස් වන විට ඔහු යාර තුන්සීයක් පමණ දුරට අඟල් හයක් පමණ ගැඹුරට ඇළ කැපුවේ ය.

කුලී වැඩ කොට සවස ගෙදර එන මිනිසුන්ට තනියම ඇළ කපන සියදෝරිස් පෙනිණ.

"ගොන් බඳින කණුවක්!" යි කියමින් ඔවුහු සිනා සුණහ.

සියදෝරිස්ගේ බිරිය සර්ප විෂ වෛද්‍ය අබේසේකර මහතාගේ නිවෙසේ වැඩ කිරීමට ගියා ය. ඇයට හාල් සහ තුනපහ ටිකක් ඒ නිවෙසින් ලැබිණ.

පසු දා ද සියදෝරිස් ඇළ කැපීමට ගියේ ය. බිරියට වෙද නිවසේ වැඩ තුබුණු හෙයින් ඒ සතියේ ම ඔහුට ඇළ කැපීමට හැකි විය.

සතියකට පසු ඇළ බැලීමට ආ අසල්වැසියෙක්,

"ඔය ඇළ දිගේ වතුර ඒවි ය?" ඇසී ය.

සියදෝරිස් පිළිතුරු දුන්නේ නැත.

"අපේ ඉඩම්වලට නම් ඔය වතුර ගෙනියන්න බැහැ. අර හරියෙන් උසයි," තවත් අසල්වැසියෙක් කී ය.

සියදෝරිස් ඇළ මඟ ලකුණු කෙළේ උස් තැන් මඟහරිමිනි. දෙවන සතියේ ඒ ඉඩම්වලට අර කුඩා ඇළ සම්බන්ධ විය. රොට වැව සිය ඉඩම්වලට සම්බන්ධ වී ඇති සැටි එදා සවස කුලී වැඩට ගොස් පැමිණි අසල්වැසියනට පෙනිණ.

"හෙට උදේ වැව ළඟ ඉතිරි ටිකත් කපනවා. එතකොට ඇළට වතුර එනවා. උඹලා ඒක බලන්න වරෙල්ලා."

සියදෝරිස් කීවේ ආඩම්බරයෙනි.

ඔහු ගේ සිරුර අඩකින් පමණ කෙට්ටු වී ඇති සැටි ඔවුන්ට පෙනිණ.

පසු දා උදෑසන ඔවුහු වැව ළඟට පැමිණියහ. ඇළත්, වැවත් අතර පස ඉවත් කිරීමත් සමඟ ඇළට වැව් වතුර ආවේ ය. මඟ නතර වෙමින්, හෙමින් හෙමින් ඒ ඉඩම්වලට වතුර ගැලුවේ ය.

මිනිස්සු ප්‍රීතියෙන් කෑගැසූහ.

"සියදෝරිස් අයියා දිනුවා!" එක් කුලීකාරයෙක් කී ය.

"නැහැ. අපි ඔක්කොම දිනුවා," සියදෝරිස් අයියා කී ය.

මිනිස්සු කෑගැසූහ.

එදා පවුල් තිස් පහේ ම අය උදලු ගෙන ඇළ ගැඹුරට පළලට කැපීම ඇරැඹූහ.

තවත් දෙසතියකට පසු ඉඩම් වගා කිරීමට සෑහෙන තරමට වතුර ප්‍රමාණයක් ලබා ගත හැකි විය.

මේ ආරංචිය ඇසූ ජනපද නිලධාරි ගාමිණී ජී. පුංචිහේවා මහතා අබේසේකර ගමට පැමිණියේ ය.

රජයේ ඉඩම්වල අනවසරයෙන් ඇළක් කැපීම නිසා සියදෝරිස්ට හිර ගෙදරට යන්නට සිදු වනු ඇතියි සමහරු කීහ.

එහෙත් පුංචිහේවා මහතා සියදෝරිස්ගේ අත සිඹ ඔහුට සිය ප්‍රශංසාව පළ කළේ ය.

"රන් පවුම් දෙන්න වටින වැඩක් මේක!" ඔහු කීවේ ය.

ඊළඟ කන්නේ මුළු පළාතෙන් ම වැඩි අස්වැන්නක් ලැබුණේ ඒ ඉඩම්වලිනි.

මෙය 'සියදෝරිස් ව්‍යාපාරය' නමින් ප්‍රකට විය. අද පවුල් හැත්තෑවකට වැඩි ප්‍රමාණයක් මේ ඇළ ංනිසා ජීවත් වෙති.

සියදෝරිස් දැන් මහලු ය. ඔහුට උදැල්ල ඇල්ලිය නොහැකි ය. එහෙත් ඔහුට අග හිඟයක් නැත. ඔහුගේ කුඹුරෙන් ලැබෙන අස්වැන්නට අමතර ගමේ ගොවි තරුණයෝ ද ඔහුට වී සහල් සපයති.

"ලෝකයේ ඔබට ඇති මිහිරි ම හඬ කුමක් දැ?"යි ඇසූ විට ඔහු මෙසේ පිළිතුරු දෙයිඃ
"අර ඇළේ වතුර බසින හඬ."

පුවත්පත් විශේෂාංග රචනය, දෙනගම සිරිවර්ධන

පුවත්පත්වල විවිධාකාර වූ විශේෂාංග ලිපි දක්නට ලැබේ.

පුද්ගල චරිත වටා ගෙතුණු විශේෂාංග ලිපි

උදාහරණ:- 'අප්‍රිකානු සිංහයා ලොවෙන් සමුගනී'

නෙල්සන් මැන්ඩෙලාගේ ළමා කාලය, තම ජාතීන්ගේ නිදහස පතා සටන් කිරීම, සිරගත ව ගෙවූ ජීවිතය, හිරෙන් නිදහස් ව පැමිණ දකුණු අප්‍රිකාව නිදහස් දේශයක් කිරීම, ඔහුගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ ආදි තොරතුරු එහි අන්තර්ගත වේ.

චාරිකා ඇසුරෙන් ලියැවෙන විශේෂාංග ලිපි

උදාහරණ:- 'නෙත් සිත් ඇද බැඳ ගන්නා පේරාදෙණිය රාජකීය උද්‍යානය'

පේරාදෙණිය උද්භිද උද්‍යානයේ ආරම්භය, පිහිටීම, එහි ඇති ශාක වර්ග, එහි වටිනාකම හා එහි සුන්දරත්වය.

යම් නිර්මාණ ඇසුරෙන් ලියැවුණු විශේෂාංග ලිපි

උදාහරණ:- 'ළමා ලොවේ සදාකාලික මිතුරා - අඹ යහළුවෝ'

ටී.බී. ඉලංගරත්න මහතාගේ 'අඹ යහළුවෝ' ළමා නවකතාව හා එහි අන්තර්ගතයෙන් ළමා ලොවට දෙන පණිවිඩය.

විද්‍යාත්මක තොරතුරු ඇසුරින් ලියැවෙන විශේෂාංග ලිපි

උදාහරණ:- 'ඩෙංගු මදුරු බිත්තර පාලනයට ඉස්ගෙඩියන්ගේ දායකත්වය'

ඩෙංගු මදුරු වසංගතය දුරු කිරීමේ අසීරුතාව හා ඒ සඳහා මදුරු බිත්තර පාලනයට ඉස්ගෙඩියන් යොදා ගැනීමෙන් කළ අධ්‍යයනයක් ඇසුරෙන් ලියැවුණු විශේෂාංග ලිපියක්.

විචාර විශේෂාංග ලිපි

උදාහරණ :- 'හැම අත්දැකීමක් ම නිර්මාණ රචකයකුට වැදගත්'

නිර්මාණාත්මක කෘතියක් පිළිබඳ ව විචාරාත්මක ව ලියැවෙන විශේෂාංග.

දරුවන්ගේ කුතුහලය දනවන විශේෂාංග ලිපි

උදාහරණ:- 'කුහුඹු ලොවේ රස තොරතුරු'

කුහුඹුවන්, ඔවුන්ගේ චර්යාවන් හා ජීවන රටාව ආදි තොරතුරු අන්තර්ගත වන විශේෂාංගයක්.

මෙවැනි විවිධ විශේෂාංග ලිපි කොතෙකුත් පුවත්පත්වල දක්නට ලැබේ.

විශේෂාංග ලිපි රචනයේ දී අවධානය යොමු කළ යුතු කරුණු.

- විශේෂාංග ලිපියක් ලිවීමේ දී හැමට එය එක සේ තේරුම් ගැනීමට හැකි වන පරිදි භාෂාව ඉතා සරල ව යොදා ගත යුතු ය.
- ඕනෑ ම කටුක පුවතක් රසවත් ලෙස ඉදිරිපත් විය යුතු ය.
- ආරම්භය ආකර්ෂණශීලී විය යුතුවාක් මෙන් ම මුළු අරුත කැටිකර දක්වන අවසානයක් ද තිබිය යුතු ය.
- ලේඛනය වඩාත් හෘදයංගම ව ඉදිරිපත් කළ යුතු අතර සිද්ධියේ හැම පැත්තක් ම විවරණය වී තිබිය යුතු ය.
- අනවශ්‍ය වැල් වටාරම් ඇතුළත් නො කර සංක්ෂිප්ත ව අදාළ කරුණු පමණක් තෝරාගෙන පාඨකයා ග්‍රහණය වන ලෙසත් කුතුහලය දනවන ලෙසත් ලිවිය යුතු ය.
- ප්‍රස්තාර, අධෝ ලිපි, සංඛ්‍යා ලේඛන ආදිය ඊට ඇතුළත් නො කළ යුතු අතර පෞද්ගලික චරිතයකට හෝ ආගමකට හෝ ජාතියකට හෝ අපහාසයක් සිදු නො වන ලෙස ලිවිය යුතු ය. සදාචාරාත්මක බව සුරැකිය යුතු ය.
- හැම විට ම සත්‍ය කරුණු පමණක් ම ඊට ඇතුළත් විය යුතු ය.
- අධිකරණයේ නඩු විභාගයක් පැවැත්වෙන කරුණක් පිළිබඳව ලිවීමේ දී ඊට යම් බලපෑමක් සිදු නො වන ලෙස ලිවිය යුතු ය.
- ශීර්ෂ පාඨය සිත් ගන්නාසුලු ලෙස යොදා ගත යුතු ය.

ලිඛිත අභ්‍යාස

1. පහත දී ඇති ප්‍රවෘත්ති ඇසුරින් විශේෂාංග ලිපි සකසන්න.

i.

තෙල් කාන්දුවෙන් සයුරට හානි

පසුගියදා පානදුර අවට මුහුදේ නැංගුරම් ලා තිබූ නෞකාවක් මුහුදුබත් වීමත් සමග එහි තිබූ තෙල් විශාල ප්‍රමාණයක් අවට සාගරයට මුසු විය. හැම වසරකට ම මෙලෙස තෙල් ගැලුම් මිලියන 706ක් පමණ සාගරයට එකතු වේ.

ii.

සාමාන්‍ය පෙළ උසස් ලෙස සමත් වන්නට දෑත් අහිමි ශිෂ්‍යාවක් සමත් වෙයි.

දෑත් අහිමි වුව ද, දකුණු පාදයෙන් අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පිළිතුරු ලියා විශිෂ්ට සම්මාන 6ක් සහිත ව සමත් වන්නට විදුජය විද්‍යාලයයේ ජයනි බණ්ඩාර ශිෂ්‍යාව සමත් වූවා ය.

උපතින් ම දෑත් අහිමි ඇය තම සියලු කටයුතු තමා විසින් ම කර ගැනීමට පුංචි අවධියේ සිට ම පුරුදු ව සිටියා ය. ඇය අධ්‍යාපන කටයුතු මෙන් ම විෂය බාහිර කටයුතු ද මැනවින් ඉටු කළ බව ඇය උගත් පාසලේ විදුහල්පතිතුමා පවසයි.

2. වඩාත් ඔබ සිත් ගත් සිදුවීමක් ඇසුරු කරගෙන විශේෂාංග ලිපියක් සකසන්න.

ප්‍රායෝගික අභ්‍යාස

1. මිහිර, විජය, විදුසර වැනි ළමා පුවත්පත් හා සති අන්ත පුවත්පත්වලින් විවිධ විශේෂාංග ලිපි එකතු කරන්න. ගොනුවක් සකසන්න. මෙය පන්තියේ ක්‍රියාකාරකමක් ලෙස ක්‍රියාත්මක කරන්න.